# පහළ ගිරිබාව

# එල්ලංගා කළමනාකරණ සැලැස්ම - CMP



**කෘෂිකර්ම අමාත්‍යාංශය**
**දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය**
**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය - වයඹ පළාත**


in descending order from high to low
elevation.


while ensuring the sustainability
of the natural ecosystems

# පටුන


1 හැඳින්වීම……………………………………………………………………………4
1.1. පහළ ගිරිබාව එල්ලංගාව හා එහි පිහිටීම……………………………………………………4
1.2.1. පහළ ගිරිබාව එල්ලංගා පද්ධතියේ සිතියම……………………………………………...5
1.2.2. පහළ ගිරිබාව එල්ලංගාව හා එහි ව්‍යාප්තිය ……………………………………………....5
1.2.3. එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු…………………………………………………...6
1.2.4. එල්ලංගාවේ වැව් පිලිබද සිතියම් හා තොරතුරු……………………………………………7
1.2. පහළ ගිරිබාව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම………………..9
1.3. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම………………………………………………..10
1.4. එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය……………………………………..12
1.5. එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය……………………………………...12
1.6. එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය…………………………...12
1.7. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු………13
1.8. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීම…………………14
2 . එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය………………14
2.1. පහල ගිරිබාව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හදුනා ගැනීම……………………15
3. පහල ගිරිබාව එල්ලංගාවේ පැතිකඩ……………………………………………………16
3.1. භූගෝලීය (Geographical ) තොරතුරු……………………………………………………...16
3.2. භූ විද්‍යාත්මක (Geological) තොරතුරු……………………………………………………..16
3.3. ජල විද්‍යාත්මක තොරතුරු…………………………………………………………………..17
3.4. මාසිකව හා වාර්ෂිකව එල්ලංගාවට ලැබෙන වර්ෂාපතනය………………………………..17
3.5. පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු…………………………………………19
3.6. එල්ලංගාව තුළ සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම්……………………………………22
3.7. එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු………………………………………………………23
3.8. එල්ලංගාවේ පවතින ඉදිකිරීම්……………………………………………………………24
3.9. එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව………………………………………………24
4. එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය……………………………………………………24
4.1. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග……………………………………………………25
4.2. හඳුනාගත් ගැටලු අතරින් සැලකිල්ලට භාජනය කළ උග්‍ර ගැටළු……………………………26
4.3. පහළ ගිරිබාව හරස්කඩ චාරිකාවෙන් හඳුනාගත් ප්‍රමුඛතාගත කල ගැටලු හා යෝජිත උපාය මාර්ග හා සැලැස්ම………………………………………………………………………..28
5. එල්ලංගා කළමනාකරණයේ මූලික සැලැස්ම…………………………………………………31
5.1. පහළ ගිරිබාව එල්ලංගා පැතිකඩ හා මූලික සංවර්ධන සැලැස්ම……………………………31

5.2. යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්, වැය වන මුදල සහ පාර්ශවකරුවන්ගෙන් අපේක්ෂිත දල මූල්‍ය දායකත්වය……………………………………………………………………………41
5.3. දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය තුල එමගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන ක්‍රියාකාරකම්……………………………………………………………...42
5.4. එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය……………………..43

# 1. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැගි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කළමණාකරනයක් තුලින් "දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ" සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කළමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කළමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කළමණාකරනය කිරීම එල්ලංගා කළමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කළමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කර ඇත. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.

## 1.1. පහළ ගිරිබාව එල්ලංගාව හා එහි පිහිටීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තඹුත්ත ගොවිජන සේවා බල ප්‍රදේශයේ ග්‍රාම නිලදාරී කොට්ඨාස 08 ආවරණය කරමින් පහළ ගිරිබාව එල්ලංගාව මුහුදු මට්ටමේ සිට මීටර් 72.9 ක පමණ උන්නතාංශයකින් පීහිටා ඇත. පහල ගිරිබාව එල්ලංගාව කලා ඔය ද්‍රෝණියේ පිහි ඇති අතර, මෙම එල්ලංගාව පවත්නා එල්ලංගා අතරින් තරමක් විශාල එල්ලංගාවකි .

ගොවි සංවිධාන (FOs) 11 ක් සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ ( GN ) 8 කින් එල්ලංගාව ආවරණය කරයි. පහළ ගිරිබාව එල්ලංගාව වැව් 64 කින් සමන්විතය. ව්‍යාපෘතිය ආරම්භයේදී වැව් 25 ක් ප්‍රතිසංස්කරණය සඳහා ව්‍යාපෘතිය මගින් තෝරාගෙන ඉදිකිරීම් ආරම්භ කර ඇත. මෙයට අමතරව තවත් කුඩා අමුණු 30 ක් පමණ එල්ලංගාව තුල පවතී. මෙම එල්ලං ගාව හෙක්. 6604 කින් සමන්විත වේ.

ආසන්නයේ කලා ඔයෙන් පෝශනය වන රාජාංගන ජලාශය පිටා ඇත. සමස්ථ එල්ලංගාවට ලැබෙන වැසි ජලය ගිරිබා ඔයට වැටී රාජාංගන ජලාශයට පහලින් පිහිටි සෝලේ වැව පෝෂණය කරමින් පතනේ ඇල ඔස්සේ කලා ඔයට ගලා බසී .

මෙම පහල ගිරිබාව එල්ලංගාව වරා වැව, අන්දරවැව, මකුල්ලගහමුල, වැටිය වාව, සහ අමුණුකොළේගම වශයෙන් කුඩා එල්ළංගා 5 කින් යුක්ත බව පැරණි ගොවියන්ගේ මතයයි. එහෙත් එල්ලංගාව හැඳින්වීමේ දී පහල ගිරිබාව වැවේ පිහිටීම අනුව පහල ගිරිබාව වශයෙන් මෙම එල්ලංගාව හැඳින්වේ.


පහල ගිරිබාව එල්ලංගාව තුල විවිධ ජනප්‍රවාදයන් පවතී හත්පීකුච්චි පර්වතයේ දී සිරි සගබෝ හිස දන්දුන් බවත් ගිරිබා හතක් පැවති බවත් ඉහල ගිරිබා කඳුවැට්යට ලැබුනු ජලය ගලා ගිය ගිරිබා ඔය ස්ථාන හතකින් හරස්කර එකල ජනතාව ජලය පරිහරණයට යොදාගත් බවත් එය සත් ගිරිබාව වශයෙන් හඳුන්වා ඇති බවත් කියවේ. තඹුත්ත, ඉහල, මැද, පහල, සෝලේ, පතනෙ හා ගිරිබාව මෙම ගිරිබා හත වේ. මේ අනුව අදටත් පවතින සෝලෙ ගිරිබාවට අනුව පවතින සෝලේ වැව රාජාංගන ව්‍යාපාරය තුල පවතින ඉතා දර්ශණීය වැවකි.

ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් පහල ගිරිබාව එල්ලංගාව


1.1.1 වගු අංක 01

| අංක | ග්‍රානි. කොට්ඨාශයේ නම හා අංකය | ව්‍යාප්තිය හෙක්. | ජනගහනය | ප්‍රදේශය තුල ගොවි සංවිධාන |
|---|---|---|---|---|
| 01 | පහල ගිරිබාව 23 | 547.7 | 752 | 01 |
| 02 | වේරගල 24 | 580.1 | 752 | 02 |
| 03 | ඉහල ගිරිබාව 26 | 610.9 | 1539 | 01 |
| 04 | තඹුත්ත 28 | 596.0 | 795 | 01 |
| 05 | මයිලැව 30 | 525.6 | 723 | 01 |
| 06 | මඩිගේ 31 | 982.3 | 1774 | 02 |
| 07 | අලියා වැටුනු වැව 32 | 825.3 | 1288 | 02 |
| 08 | ගම්පොල 33 | 1937.7 | 496 | 01 |
| | එකතුව | 6604.2 | 8883 | 11 |

1.1.2. පහළ ගිරිබාව එල්ලංගා පද්ධතියේ සිතියම



### 1.1.3. පහළ ගිරිබාව එල්ලංගාව හා එහි ව්‍යාප්තිය





GNDs Belonging to Pahala Giribawa Cascade

1.1.4. එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

වගු අංක 2

| තොරතුරු | විස්තරය |
|---|---|
| දිස්ත්‍රික්කය | කුරුණෑගල |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ගිරිබාව |
| මැතිවරණ බල ප්‍රදේශය | ගල්ගමුව |
| ගංගා ද්‍රෝණියේ නම | කලාවැව ගංගා දෝණිය |
| එල්ලංගාවේ නම | පහල ගිරිබාව |
| ගොවිජන සේවා බල ප්‍රදේශය | තඹුත්ත |
| ග්‍රාම නිලධාරී වසම් | පහල ගිරිබාව/වේරගල/ඉහල ගිරිබාව/තබුත්ත/මයිලෑව |
| එල්ලංගාවේ මුලු භූමි ප්‍රමාණය හෙක්: | හෙක්: 6604.2 |
| ජලපෝශක ප්‍රදේශයේ නම | ඉහල ගිරිබාව, මයිලෑව කදුවැටිය |
| පැහැදිළි ජලපෝශක සංඛාව | 6 |
| කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන වැව් සංඛ්‍යාව | 64 |
| වනාන්තර ප්‍රදේශ | හෙක්: 74 |
| මුඩු බිම් | හෙක්: 109 ( හදුනාගත් ) |
| එල්ලංගාවේ ජීවත්වන පවුල් සංඛ්‍යාව | 1650 |
| ගෙවතු | හෙක්: 312 |
| පුණරුත්ථාපනයට යොමු කල වැව් සංඛාව | 25 |
| පුණරුත්ථාපනයට යොමු නොකල වැව් සංඛාව | 39 |

එල්ළංගාවේ වැව් පිළිබඳ සිතියම් හා තොරතුරු




| No | Tank_Name |
|---|---|
| 1 | Pahala Giribaw a Wew a |
| 2 | Kivul Wew a |
| 3 | Kandegalayaya w ew a/kande w ew a |
| 4 | Dunuke Wew a/Dunu Madalaw a Wew a |
| 5 | Siyambala Gama Wew a |
| 6 | Aluth Wew a |
| 7 | Bodiyagama Wew a |
| 8 | Wembuw a Kuda Wew a /Kuda Gal Kadaw ala Ihala Wew a |
| 9 | Bapath Wew a / Bapaththew a Iha a Wew a |
| 10 | Bendapu Wew a |
| 11 | Wal Paluw a Aluth Wew a |
| 12 | Punchi Aliya Wetunu Wew a |
| 13 | Punchi Aliya Wetunu Ihala Aluth Wew a |
| 14 | Wal Paluw a Ihala Palu Gaha w ew a |
| 15 | Kuda Gal Kadaw ala Kande Wew a |
| 16 | Weera Ketiyaw a Wew a |
| 17 | Waalappalam Wew a |
| 18 | Palugama Maha Wew a |
| 19 | Ihala Thmmanna Ketiyaw a Wew a |
| 20 | Maha Thammanna Ketiyaw a Wew a |
| 21 | Aliya Wetunu Wew a / Gal Wew a |
| 22 | Aliya Wetunu Wew a Ihala Wew a |
| 23 | Rathmal Gaha Wew a |
| 24 | Dunhene Gama Wew a |
| 25 | Bapath Wew a |

STEP approved and under construction

වගු අංක - 2

# Tank Data

| NO | Tank | Irrigable Area (ha) | No of Farm Families | Gross Catchment (ha) | Net Catchment (ha) | Longest water course (ft) | Water course elevation difference (ft) | Catchment gradient | Net Catchment Details | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | Unclassified (ha) | Chena (ha) | Other Cultivation (ha) | Rock(ha) | Forest (ha) | Homestead (ha) | Paddy (ha) | Scrub (ha) | Water (ha) | Barren Land (ha) |
| 1 | Pahala Giribawa Wewa | 88.09 | 250 | 3040.29 | 652.00 | 24193 | 457.00 | 1.89 | 2.52 | 6.71 | 2.26 | - | - | 94.54 | 214.11 | 234.74 | 61.64 | 35.48 |
| 2 | Kandegalayaya wewa/kande wewa | 13.18 | 30 | 29.50 | 29.50 | 2149 | 564.00 | 26.24 | - | - | - | 0.20 | 11.54 | - | - | 12.43 | 5.32 | 0.01 |
| 3 | Dunuke Wewa/Dunu Madalawa Wewa | 7.16 | 12 | 14.14 | 8.25 | 1501 | 40.00 | 2.66 | - | - | - | - | - | 4.30 | - | 2.86 | 0.70 | 0.39 |
| 4 | Siyambala Gama Wewa | 14.24 | 40 | 48.52 | 19.60 | 2830 | 52.00 | 1.84 | - | - | - | - | - | 0.12 | 0.10 | 7.32 | 4.50 | 7.56 |
| 5 | Aluth Wewa | 15.22 | 25 | 15.90 | 15.90 | 1833 | 559.00 | 30.50 | - | - | - | 0.38 | 6.80 | | - | 6.31 | 2.41 | 0.00 |
| 6 | Bodiyagama Wewa | 9.45 | 20 | 89.30 | 76.90 | 4364 | 410.00 | 9.40 | - | - | 5.02 | 0.01 | 7.26 | 28.27 | - | 26.10 | 6.30 | 3.94 |
| 7 | Wembuwa Kuda Wewa /Kuda Gal Kadawala Ihala Wewa | 3.02 | 8 | 97.56 | 24.90 | 3488 | 374.00 | 10.72 | - | - | 9.42 | - | 1.35 | 2.14 | - | 10.86 | 1.13 | - |
| 8 | Elapath Wewa / Elapaththewa Ihala Wewa | 16.75 | 28 | 41.10 | 18.70 | 2104 | 48.00 | 2.28 | - | - | - | - | - | 0.00 | 2.10 | 12.26 | 4.34 | - |
| 9 | Bendapu Wewa | 2.78 | 15 | 25.90 | 15.90 | 1981 | 337.00 | 17.01 | - | - | - | - | 6.31 | 0.06 | 3.26 | 4.91 | 1.36 | - |
| 10 | Wal Paluwa Aluth Wewa | 1.62 | 10 | 3.25 | 3.25 | 494 | 26.00 | 5.26 | - | - | 1.45 | - | - | | - | 1.28 | 0.52 | - |
| 11 | Punchi Aliya Wetunu Wewa | 10.66 | 70 | 107.98 | 33.50 | 1659 | 45.00 | 2.71 | - | - | - | - | - | 10.15 | 9.24 | 5.25 | 8.86 | - |
| 12 | Punchi Aliya Wetunu Ihala Aluth Wewa | 4.05 | 30 | 40.80 | 40.80 | 2389 | 43.00 | 1.80 | - | - | - | - | - | 13.05 | - | 24.91 | 2.84 | - |
| 13 | Wal Paluwa Ihala Palu Gaha wewa | 4.49 | 25 | 8.66 | 8.66 | 1022 | 17.00 | 1.66 | - | - | 1.20 | - | - | - | 0.95 | 5.81 | 0.70 | - |
| 14 | Kuda Gal Kadawala Kande Wewa | 2.94 | 10 | 7.27 | 7.27 | 1534 | 375.00 | 24.45 | - | - | - | - | 6.84 | - | - | - | 0.13 | 0.30 |
| 15 | Weera Ketiyawa Wewa | 6.20 | 15 | 103.20 | 25.40 | 3049 | 42.00 | 1.38 | - | - | - | - | - | 4.64 | - | 18.06 | 2.70 | 0.00 |
| 16 | Waalappalam Wewa | 6.81 | 16 | 14.00 | 14.00 | 1273 | 27.00 | 2.12 | - | - | - | - | - | - | - | 10.72 | 3.20 | 0.08 |
| 17 | Palugama Maha Wewa | 20.75 | 110 | 199.30 | 45.80 | 4929 | 58.00 | 1.18 | - | - | - | - | - | 8.00 | 22.83 | 5.73 | 9.15 | 0.09 |
| 18 | Ihala Thmmanna Ketiyawa Wewa | 2.82 | 9 | 15.30 | 15.30 | 1488 | 31.00 | 2.08 | - | - | - | - | - | - | - | 9.71 | 2.80 | 2.79 |
| 19 | Maha Thammanna Ketiyawa Wewa | 10.28 | 40 | 77.80 | 48.50 | 3049 | 47.00 | 1.54 | - | - | - | - | - | - | - | 31.60 | 7.14 | 9.76 |
| 20 | Aliya Wetunu Wewa / Gal Wewa | 28.79 | 70 | 92.48 | 38.20 | 4580 | 53.00 | 1.16 | - | - | - | - | - | 5.14 | 12.01 | 0.00 | 13.15 | 7.90 |
| 21 | Aliya Wetunu Wewa Ihala Wewa | 2.71 | 7 | 15.18 | 11.20 | 1697 | 24.00 | 1.41 | - | - | - | - | - | - | - | 7.17 | 1.33 | 2.70 |
| 22 | Rathmal Gaha Wewa | 5.98 | 25 | 28.90 | 28.90 | 2273 | 41.00 | 1.80 | - | - | - | - | - | - | 0.00 | 9.86 | 3.54 | 15.50 |
| 23 | Dunhene Gama Wewa | 7.50 | 18 | 42.98 | 40.10 | 2521 | 48.00 | 1.90 | - | - | - | - | - | - | - | 28.44 | 2.18 | 9.48 |
| 24 | Elapath Wewa | 2.53 | 10 | 26.40 | 16.10 | 2367 | 60.00 | 2.53 | - | - | - | - | - | 2.19 | 0.48 | 10.80 | 1.47 | 1.16 |
| 25 | Kivule Wewa | 3.97 | 18 | 50.30 | 36.30 | 2998 | 37.00 | 1.23 | - | - | - | - | - | 7.90 | 10.36 | 3.18 | 3.08 | 11.78 |

## 1.2. පහළ ගිරිබාව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම

පහළ ගිරිබාව එල්ලංගාව හෙක්ටයාර් 6604.2 කින් සමන්විතය. වැව් 64 කින් හා කුඩා අමුණු 30 කින් යුක්ත වේ. මෙම වැව් අතරින් 25 ක් ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කෙරේ. ඉතිරි වැව් අමුණු ද පුණරුත්ථාපනයට භාජනය කල යුතුව ඇත. (අමුණු 30 ක් හා කුඩා අනු කුඩා වැව් 39 ක්) මෙම පද්ධතිය තුල කුඹුරු හා අතිරේක ආහාර බෝග වගාව අක්කර ..........කි. මෙම වගා කටයුතු වල නිරතවන ගොවීන් ගණන ..........කි. මේ සමගම එල්ලංගාවේ සමස්ථ ජනගහනය 8883 කි. මෙම සියලු දෙනා එල්ලංගාව තුල විවිධ මානුෂික ක්‍රියාකාරකම් වල නිරතවේ. මේ අනුව එල්ලංගාව දැනටමත් විශාල හායනයකට පත්ව ඇත. කාලයක් තුල සිදුවී ඇති වණ විනාශය, හේන් වගාව, පාංශු ඛාදනය හේතුන් නිසාම වැව් හා ඇල පද්ධතිය ගොඩවීම නිසා එල්ලංගාව බලවත් තර්ජනයකට මුහුණ දෙමින් සිටී. වැව් වල ජලය සීග්‍රයෙන් සිඳී ගොස් ඇත. ජල මාර්ග සිඳී ගොස්ය. දේශගුණික විපර්යාශයන් අනුව මෙම තත්වය තව දුරටත් උග්‍රවනු ඇත. මෙම තත්වයෙන් මෙම එල්ලංගා පද්ධතිය බේරා ගැනීමට නම් වැව් පුණරුත්ථාපනය පමනක් කොහෙත්ම ප්‍රමානවත් නොවේ. මෙම තත්වයට එකම විසඳුම වන්නේ සමස්ථ එල්ලංගාවම තිරසර සංවර්ධනයකට භාජනය කිරීමයි. ඒ අනුව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර පහල ගිරිබාව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ අවධානය යොමු කර ඇත. එහිදී එල්ලංගා කළමනාකරණ කමිටුව එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර ඒ මගින් ක්‍රියාත්මක විය යුතුය.

## 1.3. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කළමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කළමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම්, "එල්ලන්" සහ "ගාව" යන්නයි. එල්ලන් යනු එල්ලෙන යන්නයි. ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි. ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණය එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමට, නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කළමණාකරන කමිටු 53 ක් පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කළමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.


ඒවා නම්,

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය ලේකම්වරු
- ගොවි සංවිධාන
- ප්‍රජා මූලික සංවිධාන
- ජල සම්පත් මණ්ඩලය
- ආපදා කළමණාකරන කාර්යාංශය
- පොලිස් දෙපාර්තමේන්තුව
- ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
- පරිසර අධිකාරිය
- පෞද්ගලික අංශය
- ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව

යන ආයතන වේ.

එල්ලංගා කළමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මුල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත. ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනේ දක්වා ඇත.

එල්ලංගා කළමනාකරණයට අදාළ ආයතනික රාමුව



## 1.4. එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය

මෙරට ඒකාබද්ධ කළමණාකරණ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහවැලි ව්‍යාපාරය හා ඉන්මාස් වැඩ සටහන ප්‍රමුඛතාවය ගනී. මෙම වැඩසටහන් ජලය හා බැදුනු මහා වාරිමාර්ග පදම් කරගත් ව්‍යාපාර වේ. මෙම වැඩ සටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් වැඩ සටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන් ISMP ව්‍යාපෘති ) වැදගත් තැනක් ගනු ලබන්නේ එයද ලෝක බැංකු අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවි ජනපද ව්‍යාපාර වල ගොවි සංවිධාන පිහිටුවීමේ ආරම්භක පියවරක් ගනු ලැබුවේ මෙම ඉන්මාස් වැඩ සටහන තුලින්ය. මෙම ගොවි ජන පද ව්‍යාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදු වේ. මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉටු කිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක ………. දරණ ජේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත. ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 1.5. එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික චත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කළමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කර ඇත. මෙම පැතිකඩ එල්ලංගා පද්ධති කළමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

## 1.6. එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය

පහළ ගිරිබාව එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබීය. එල්ලංගා කළමණාකරණ කමිටුවේ විශේෂ රැස්වීමක දී එල්ලංගා පැතිකඩක අවශ්‍යතාවය හා ඒ තුලින් එල්ලංගා සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සාකච්ජාවට ගනු ලැබීය. එම පැහැදිලි කිරීම් අනුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ සියලු සාමාජිකයින් මෙම හරස්කඩ චාරිකාව සංවිධානය කිරීමට එකගතාවය පල කරන ලදී. ඉන් අනතුරුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ නියෝජිතයන් හා ගොවි සංවිධාන නියෝජිතයන් සමග එල්ලංගා හරස්කඩ චාරිකාව සැලසුම් කරන ලදී. මේ සඳහා යෝජිත දිනය ලෙස යොදා ගනු ලැබුවේ 2023.05.18 දිනයයි. මෙම චාරිකාව කණ්ඩායම් 5 කින් යුක්ත විය.

01.කණ්ඩායම කුඩාගල්කඩවල මහසන් ගොවි සංවිධානයේ මග පෙන්වීම යටතේ බෝධියාගම වැවේ සිට ඇලපත් වැව දක්වා කි. මී. 03 ක දුර ගමන් මග කි.

02.කණ්ඩායම අලියා වැටුණු වැව ගොවි සංවිධානයේ මග පෙන්වීම යටතේ අලියා වැටුනු වැව ග්‍රාම නිලධාරී කාර්යාලයේ සිට වල්පාලුව ඇල පත්වැව දක්වා ගමන් මග දුර කි. මී. 3 .5 කි.

03.කණ්ඩායම පාලු වැව ගොවි සංවිධානය මග පෙන්වීම යටතේ පාලුවැව මහ වැව වාන සිට මහ තැම්මැන්නා වැටිය වැව දක්වා කොටස කි. මී. 2.5 කි.

04. කණ්ඩායම අලියා වැටුනු වැව ගොවි සංවිධානය මග පෙන්වීම අලියා වැටුණු වැව ග්‍රාම නිලධාරී කාර්යාලය සිට කප්පරවෙලිලිය වාන් ඇල දක්වා කොටස කි. මී. 2.5 කි.

05. කණ්ඩායම මඩිගේ ගොවි සංවිධානය නායකත්වය යටතේ අලුත්වැව වාන සිට දූනුමඩලෑව වාන දක්වා කි. මී. 2.3 කි.

මෙම සැලැස්ම අනුව පහළ ගිරිබාව එල්ලංගා පද්ධති චාරිකාව කිලෝ මීටර් 13 කින් යුක්ත විය. මේ සමග ගොවි සංවිධාන සමඟ නිලධාරි කණ්ඩායම් අනුයුක්ත කරවීය.
මෙදින ලබාගත් දත්ත නැවත එල්ලංගා කළමණාකරණ කමිටුවට ඉදිරිපත් කර ඒම දත්ත වල නිවැදිතාවය සටහන් කර ගැනීමට යෙදුනි. මීටර් 100 න් 100 ට තොරතුරු ලබා ගන්නා ලද අතර ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක තොරතුරු, ජල විද්‍යාත්මක තොරතුරු, පරිසර විද්‍යාත්මක තොරතුරු, සමාජ ආර්ථික තොරතුරු සම්පත් හායනය හා සම්පත් හායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ සහ සාකච්ඡා මගින් තොරතුරු එකතු කර ගන්නා ලදී. හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන් ගොවි සංවිධාන සහ සියලු රාජ්‍ය ආයතන වල නිලධාරීන් සහභාගී වූ අතර චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලු කටයුතු සඳහා සහභාගී විය. වැඩමුළුවක් පවත්වා තොරතුරු වල නිරවද්‍යතාවය තවදුරටත් තහවුරු කර ගන්නා ලදි. මෙම එල්ලංගා පැතිකඩෙහි ඇති තොරතුරු එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතා වැදගත් වන අතර එල්ලංගාව අධ්‍යනය කරනු ලබන අයට එල්ලංගාව පිලිබඳ තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන සැලසුම් සඳහා ඉතා ඉවහල් වනු ඇත.

## 1.7. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කළමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කළමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කළමණාකරන සැලැස්මක් සකස් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ(Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම. එල්ලංගා පහසු උග්‍ර ගැටළු සඳහා වන උපාය මාර්ගික මැදිහත්වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාල වකවානුව සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු සම්බන්ධකාර ආයතනය යන මූලිකාංග ඇතුළත් එල්ලංගා පද්ධති කළමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවක කරුවන් දැනුවත් කිරීම.

## 1.8. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එළිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිලිබඳව නිවැරදි පින්තූරය දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මක් සැකසීම (Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කළමණාකරන සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

## 2 . එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

පහල ගිරිබාව එල්ලංගාවේ පවතින තත්වය දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා එල්ලංගා කළමණාකරන කමිටුවේ අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීමට සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කළමණාකරන සැලැස්මක් අවශ්‍ය බවද දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කළමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක අවශ්‍යතාවය දැනෙන්නට විය. මේ අනුව එල්ලංගාව අධ්‍යනය කිරීමටත් දත්ත හා තොරතුරු එක්රැස් කරමින් එල්ලංගා පැතිකඩක් සකස් කිරීමටත් අවශ්‍ය විය. පිලිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය. එහිදී එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුළත් බහුවිධ කාරණයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කළ යුතු අතර එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක සහ සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්වය සහ බහු සත්කාර ක්‍රමවේද භාවිතා කරනු ලැබේ. දත්ත විශ්ලේෂණ, වාර්තා ලේඛනගත කිරීම, සැලැස්ම සැකසීම සහ ගනුදෙනුකරුවන් විසින් ගණනය නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම දැ ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණය සුහුරුවාරි කෘෂිකාර්මික ව්‍යාපෘති නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. කළමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතනය එකතු වී පහත ක්‍රියාව අනුගමනය කරන.

(i) රැස්වීම් පැවැත්වීම

(ii) ද්විතීය දත්ත එකතු කිරීම

(iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම

(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හදුනා ගැනීම

(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම

(vi) එල්ලංගා පැතිකඩ සැකසීම

(vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම

(viii) එල්ලංගා සැලැස්ම සැකසීම

(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම

(x)එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු, එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කමිටුවට ඉදිරිපත් කිරිම.

## 2.1. පහල ගිරිබාව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

පහල ගිරිබාව එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6 ක දිස්ත්‍රික්ක 11 ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කළමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි . එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කළමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරීම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කළමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ වාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගා හරහා වාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී.

එවා නම්,

1. භූගෝල විද්‍යාත්මක
2. භූ විද්‍යාත්මක
3. ජල විද්‍යාත්මක

4. පාරිසරික විද්‍යාත්මක

5. මානව හැසිරීම්

6. සමාජ ආර්ථික

7. කෘෂිකාර්මික

8. වාරිමාර්ග කළමණාකරනය

9.පෝෂිත ප්‍රදේශයේ තත්වය

යන ආදියයි. මේවා එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාරකරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලාංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

## 3. පහල ගිරිබාව එල්ලංගාවේ පැතිකඩ

### 3.1. භූගෝලීය (Geographical )තොරතුරු

පහල ගිරිබාව එල්ලංගාව ගම්මාන රාශියකින් යුක්තය ඒ අතරින් තඹුත්ත, මයිලැව, පහළ ගිරිබාව ගිරිබාව, වරා වැව, සංගප්පාලය ප්‍රධාන වේ. මෙම ප්‍රදේශ ආවරණය කරමින් තඹුත්ත කන්ද, මයිලැව කන්ද, සංගප්පාලය කන්ද, හත්ති කුඡ්චි කන්ද හා හෙට්ටි ආරච්චියාගම කන්ද යනුවෙන් ශේෂ කඳු 5ක් දක්නට ලැබේ. මෙම කඳු වලට ලැබෙන වර්ෂාව අනුව ගලා යන ජලය ඉහල ගිරිබාව වැවේ සිට පහල ගිරිබාව වැව දක්වා කුඩා වැව් පොෂණය කරමින් ගලා යයි. ඉන් අනතුරුව ගිරිබා ඇල ඔස්සේ රාජාංගන ව්‍යාපාරය හරහා ගොස් සෝල වැව පුරවමින් පතන ඇල ඔස්සේ කලා ඔයට එක්වේ. මෙම කලාපය හෙක්. 6604 වන අතර කැලැව හෙක්. 74 කින්ද, මුඩු බිම් හෙක්. 109 කින් ද යුක්තය.

### 3.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

පහල ගිරිබාව එල්ලංගාව බිම් ප්‍රදේශය කඳුකර ප්‍රදේශ ආශ්‍රිතව රතු දුඹුරු පසක් දක්නට ඇත. සෙසු ප්‍රදේශ බොහෙමයක් වැලි මිශ්‍ර පසකින් යුක්තය මෙම පහත් ප්‍රදේශ වල කිවුල සහිත ජලය නිසාම ලවනතාවය වැඩිය. වැසි කාලයට පමනක් කුඩා කඳු වැටි ප්‍රදේශ හරහා ජලය ගලා යන අතර එම ජලය ඉහල ගිරිබාව, තඹුත්ත, පොතාන වැව් ඔස්සේ පැමිය පහල ගිරිබාව වැවට වැටී ගිරිබා ඇල මගින් ඉවතට ගලා යන්නේ ලැබෙන වර්ෂාව අනුව කුඹුරු හා සෙසු වගාවන් පෝෂණය කරමිනි. වැව් ඉස්මත්ත ලදු කැලැව නිරාවරණය නිසාම පෝෂක ප්‍රදේශය දුර්වලය. 1650 වන ජනගහනය ගම් වශයෙන් 37 ක වාසය කරයි බොහෝ වැව් වල ඉස්මත්ත අස්වද්දා හෝ අනවසරයෙන් අල්ලාගෙන ඇත. වැලි සෝදා අළෙවි කරන ස්ථානයක්, හෝටල් ඉදිකිරීම් මෙම එල්ලංගාව තුල ඇත. සත්ව පාලනය සැලකිය යුතු මට්ටමක ඇත. අලියා වැටුන වැව, පුංචි අලියා වැටුනු වැව, පහල ගිරිබාව වැව් ඉස්මත්ත පිට්ටනියක ස්වාභාවය දිස්වේ. ඉදි ගස් තල් ගස් මෙම වැව් ඉස්මත්තේ දන්නට ඇත. පහල ගිරිබාව වැව යටතේ පමනක් හේන් වගාව හෙක් 7 ක් හා ගෙවතු වගාව හෙක් 94 කි.


## 3.3 ජල විද්‍යාත්මක තොරතුරු

පහළ ගිරිබාව එල්ලංගාව ආරම්භයේ දී පැහැදිලි ජල පෝෂක මාර්ගයක් දක්නට නොලැබේ. එහෙත් වැව් පිහිටීමේ රටාව හා භූමියේ පවතින උන්නතාංශය අනුව එල්ලංගාවට ලැබෙන වැසි ජලය වැව් වැට හරහා ගලාගොස් පවතින කුඩා දිය පහරවල් හා ඇල මාර්ග වැසි ජල රටාව අනුව සක්‍රිය වේ. මෙසේ එක්රැස් වන ජලය පිළිවෙලින් එල්ලංගාවේ වැව්වලට එන බව කුඩා වැව් පිටාර යාමත් සමඟ පහල ගිරිබාව වැවට එක්රැස් වේ. ප්‍රදේශයේ පැහැදිලි වැව් 25 ක් පවතින අතර තවත් ඉතා කුඩා වැව් හා අමුණු 56 කින් යුක්තය. මෙම වැව් සක්‍රිය වීමත් සමඟ වී වගාව ආරම්භ වේ. සියළුම ගොවීන් වී වගාව අපේක්ෂා කරයි. එල්ලංගාව තුළ පවතින වැව් පිළිවෙලින් පහත වගුවේ දැක්වේ.

මූලාශ්‍රය දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය


මෙම වගු සටහන අනුව මුළු අක්කර ප්‍රමාණය හෙක්ටයාර් ................ කි. මුළු ජල ධාරිතාවය (මෙම කලාපය තුළ) අක්කර අඩි ........... කි. මෙම වගුව අනුව වගා ඉඩම් පරිහරණය විෂමතාවයක් දක්වයි. ඒ අනුව එක් එක් වැව් යටතේ පවතින ........... හා වෙනස් වන ........... වගා බිම් ඇත. ඉඩම් ප්‍රමාණය එම සටහන අනුව පවතින ඉඩම් ප්‍රමාණයට වගා කිරීමේ පැහැදිලි අඩුවක් දක්නට ලැබේ.

## 3.4 මාසිකව හා වාර්ෂිකව එල්ලංගාවට ලැබෙන වර්ෂාපතනය



ජල විද්‍යාත්මක තොරතුරු අනුව එල්ලංගාවට මාසිකව ලැබෙන වර්ෂාපතනය දක්වයි. ප්‍රදේශයේ ස්ථාන දෙකක පිහිටා ඇති වර්ෂාපතන දත්ත මෙයට උපයෝගී කරගෙන ඇත. (ගිරිබාව හා මහගල්කඩවල) මෙම ප්‍රස්ථාරය සළකා බැලීමේ දී මහගල්කඩවලට වැඩි වර්ෂාපතනයක් ලැබී ඇත. ඒ අනුව ගිරිබාවට ලැබෙන වර්ෂාපතනය අඩුවක් පෙන්වයි. ජනවාරි - මාර්තු අතර ලැබෙන වර්ෂාව අඩුවන අතර ජුනි, ජූලි, අගෝස්තු අතර පවතිනුයේ පිළිවෙළින් මි. මි. 13-17, 9-20, 21-35 අතර වේ. මෙය ඉතා අඩුම වර්ෂාපතනයකි.

මෙම වර්ෂාපතන දත්ත අනුව එල්ලංගාවට උපරිම වර්ෂාපතනයක් ලැබී ඇත්තේ ඔක්තෝබර්, නොවැම්බර් මාසවල පිළිවෙලින් 192 - 239 හා අප්‍රේල් මාසවල 123 - 199 වශයෙනි. මේ කාලය තුළ පහළ ගිරිබාව ලැබෙන අතිරික්ත ජලය ගිරිබා ඇල ඔස්සේ එල්ලංගාවෙන් පිටතට ගලා යයි.




මෙයට අමතරව එල්ලංගාවේ මහගල්කඩවල හා ගිරිබාව වර්ෂාපතන මාස අනුව 1990 සිට 2019 දක්වා වර්ෂාපතන දත්ත මෙහි සටහන් කර ඇත. මෙම ජල විද්‍යාත්මක තොරතුරු අනුව එල්ලංගාවේ සමස්ථ කුඹුරු ප්‍රමාණ හෙක්ටයාර් .............. කි. එහෙත් වී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් ................. කි. ඊට අමතරව ගෙවතු වගාව හෙක්ටයාර් ……… වශයෙන් ඉහත වගුව අනුව පෙන්නුම් කරයි. කැලෑව හෙක්ටයාර් 40 ක් පමණ වන අතර එහි මුළු එල්ලංගා භූමියෙන් 6% කි. මේ අනුව ඉතා දුර්වල ජලවහන රටාවන් මෙහි පවතින බව නිගමනය කළ හැකිය.

## 3.5 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

මෙම එල්ලංගාව තුල වැව් 64 ක් පවතින අතර එම වැව් 64 න් අලුත් වැව හා කන්දෙ වැව යන වැව් දෙක සම්පුර්ණයෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමිය තුල පිහිටා ඇත. මෙම වැව් දෙක යටතේ පෝෂණය වන කුඹුරු අක්කර 14 ක් පමණ පවතී. මෙම වන රක්ෂිතය තුල සිදුවන වන මානව ක්‍රියාකාරකම් හා පරිසර හානි වන සංරක්ෂණ නිළධාරීන් යම් ප්‍රමාණයකට පාලනය කරගෙන යනු ලබයි. අනෙකුත් වැව් සියල්ල ගම්මාන ප්‍රදේශයේ පිහිටා ඇත. එම වැව් ආශ්‍රිතව මානව ක්‍රියාකරක්ම් හා පරිසර හානි විශාල වශයෙන් සිදුවේ.

මෙම එල්ලංගාව තුල ඉතා විශාල වැව් ප්‍රමාණයක් හා කුඹුරු ප්‍රමාණයක් පවතී. පැහැදිලි එල්ලංගාවක ලක්ෂණ මෙම එල්ලංගාවේ නිරික්ෂණය වේ. වැව් වල කුඹුරු ඉඩම වලට පසුව නැවත පහලින් පවතින වැවෙහි ඉස්මත්ත ආරම්භ වේ. මෙම කලාප දෙක එකිනෙක වෙන්කර හඳුනාගැනීමට පවා අපසුය. පැහැදිලි මායිම් නොමැති වීම නිසා වැවේ තාවල්ල දක්වාම කුඹුරු අස්වද්දා ඇත.



වැව් තාවල්ල තුල ගස් ගොම්මන, පෙරණය ගොඩ වල දක්නට නොලැබේ. මේ නිසා වර්ෂාකාලයේදී වැව් පිටාර ගැලීමෙන් ඉවත්වන වතුර ඇල මාර්ගයක් ඔස්සේ ( Tail cannel) පහල වැව් වලට ගලා ඒම සිදුවේ. මේ හේතුවෙන් එල්ලංගාවේ පහලින් පවතින වැව් පස සෝදායාම මගින් ගොඩවීම දක්නට ලැබේ.



කිව්ලෙ වැවේ පිටාර ජලය පාළුගම වැවට විවෘත වන ඇල

තවද වැව් ඉස්මත්ත දක්වා කුඹුරු අස්වද්දා ඇති නිසා කුඹුරු සීසාන අවදියේදී කුඹුරුවල අතිරික්ත බොර ජලය පස් අංශු සමග වැවට මුදාහැරීම නිසා වැව් ගොඩ වීම තව දුරටත් සිදු වේ. පාළුගම මහ වැව එල්ලංගාවේ පහතින් පවතින විශාල වැවක් වන අතර කිව්ලෙ වැව, තම්මැන්නා වැටිය වැව හා වීරකැටිය වැව යන සියලු වැව්වල කුඹුරු ඉඩම් පාළුගම වැව ඉස්මතෙන් දක්නට ලැබේ සහ එම වැව් වල පිටාර ජලය පැමිනෙන ඇලමාර්ගද පාළුගම මහ වැවට විවෘත වේ. ගස් ගොම්මන හා පෙරණය ගොඩ වල නොමැති නිසා මෙම වැව බොහෝ සේ ගොඩවී ඇති අයුරු දක්නට ලැබේ. මීට අමතරව අනෙකුත් වැව් වලද ඉස්මත්තේ හා ඉහල ප්‍රදේශයේ හෙන් වගාව හා අනෙකුත් වගා කටයුතු පාංශු සංරක්ශණ ක්‍රම භාවිතා නොකරන නිසා වැව් ගොඩවීම දක්නට ලැබේ.



තවද එල්ලංගාව තුල නිදැල්ලේ සැරි සරන ගව රංචු හා වසරේ යම් කාල වල පැමිණෙන වල් අලි නිසා එල්ලංගාවේ පවතින වැව් වල බැම් වලට හානි සිදුවේ. වල් ඌරන්, රිලවින්ගේ ගහනය එල්ලංගාව තුල අධිකව පවතී. ගවයින් අධිකව එල්ලංගාවේ සැරි සරන නිසා ආවේනික පැලෑටි පලා වර්ග, ඖෂද පැලෑටි වදවී යාමේ අවදානමක් පවතී. කෝන්, පලු, වීර, ඉදි වැනි පලතුරු වර්ග වැව් එල්ලංගාවේ සුළු වශයෙන් දක්නට ලැබේ. තල් ගස් විශාල වශයෙන් දක්නට ලැබෙන අතර කලුකම්බෙරිය වැනි ඉතා දුර්ලබ පලතුරු ඉතාම සුලු වශයෙන් දක්නට ලැබෙන අතර ඒවාද මේ වන විට විනාශවෙමින් පවතී. මීට අමතරව අක්‍රමණශීලී ශාක වන මාන ( *Panicum maximum*), ගදපාන (*Lantana camara*) ව්‍යාප්තියක් දක්නට ලැබේ. මේ නිසා ආවේණික ශාක වද වී යාමේ අවදානමක් පවතී. ගදපාන ශාකයේ ව්‍යප්තිය නිසා ජෛව විවිධත්වය අඩුවන බව පරික්ෂණ වලින්ද තහවුරු වී ඇත.





ඊට අමතරව එල්ලංගාව තුල ගඩොල් කැපීවීම, බොරලු ඉවත් කිරිම, වැලි සේදීම යන මානව ක්‍රියාකාරකම් දක්නට ලැබේ.



## 3.6ග එල්ලංගාව තුළ සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම්

ඉහත වගු සටහන අනුව ඉතා දුර්වල ජල පෝෂිත ප්‍රදේශයක් බව නිගමනය කළ හැකිය. වගුවෙන් දැක්වෙන පරිදි වන ආවරණය හෙක්ටයාර් 40 ක් පමණ වේ. එල්ලංගාව තුළ කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන් 901 ක් පමණ වේ. වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 3918 වන අතර ගෙවතු හෙක්ටයාර් 181 කි. මේ දත්තයන් අනුව වගා බිම් හෙක්ටයාර් 483 ක් පමණ වේ. වෙනත් වගාවන් හෙක්ටයාර් 19.35 කි. ඉහත සඳහන් දත්ත අනුව හෙක්ටයාර් 6640 ක් වන භූමි ප්‍රමාණයෙන් වගා බිම් ප්‍රතිශතයක් වශයෙන් 7.27% කි. ඉන් වී වගාව 4.8% ක් වේ. 1.4% මුඩු බිම් වශයෙන් පවතී. 2.72% ක් ගෙවතු වගාව සේ දක්වයි. මෙම භූමි පරිභෝජන රටාව අනුව සැලකිය යුතු ඉඩම් ප්‍රමාණයක් හිස් ඉඩම් ලෙස දක්නට ලැබේ. කෙසේ වෙතත් ක්‍රමයෙන් සිදුවන මානුෂික ක්‍රියාකාරකම් නිසා එල්ලංගාව බරපතල හායනයකට පත්ව ඇති බව හරස්කඩ චාරිකාවෙන් පෙන්නුම් කරයි. සත්ත්ව පාලනයක් ද දැකිය හැකිය. අතහැර දමා ඇති භූමිය සංවර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් යොදා නොගතහොත් මෙම භූමිය ද අනවසරයෙන් විවිධ වෙනස්කම් වලට භාජනය වීම වැළැක්විය නොහැකිය. ගෙවතු වගාවක් දක්නට ලැබේ. ඒ සඳහා භූගත ජල සම්පත් යොදාගෙන ඇත. සතුන් දඩයම් කිරීම එල්ලංගාව තුළ අප්‍රසිද්ධියේ සිදු වේ. ඌරන්, මුවන් දඩයම් කරන බවත් එම මස් හොර රහසේම අළෙවි කරමින් මුදල් උපයා ගන්නා බවට තොරතුරු ලැබී ඇත. ගඩොල් කැපීම හෝ සේදීම එල්ලංගාව තුළ ස්ථාන කිහිපයකම සිදු වේ. එල්ලංගාව තුළ අනවසර ඉදිකිරීම් බහුලව දක්නට ලැබේ. ප්‍රධාන ජනාකීරණ ප්‍රදේශ හා මාර්ගය දෙපස ක්‍රමයෙන් ස්ථිර ගොඩනැගිලි ඉදිවෙමින් ඇත. සුප්‍රසිද්ධ නේවාසික ඉංග්‍රීසි පාසලක් එල්ලංගාව තුළ ඇත. දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පැමිණෙන සිසුන් මෙම ඉංග්‍රීසි පාසලේ නේවාසිකව ඉංග්‍රීසි අධ්‍යාපනයේ නිරත වී ඇත. කැලේ ගොස් මී පැණි රැස් කරන පිරිස් ද සිටිති. කම්කරුවන් වශයෙන් ජීවිකාව පවත්වාගෙන යන පිරිස් ඇත. යාබදව ඇති රාජාංගන ව්‍යාපාරයට කම්කරුවන් වශයෙන් ගොස් සේවාව ලබාදෙන කම්කරුවන් ද ප්‍රදේශයේ සිටිති. තවද මෙම ඉඩම්වල මෙන්ම ප්‍රදේශයේ ගස් කපා අලෙවි කිරීමෙන් ජීවිකාව ගෙනයන පිරිසද සිටිති. මෙම ගස් කැපීම බොහෝ දුරට අනවසරයෙන් සිදුවන අතර තොග වශයෙන් තදාසන්න ප්‍රදේශවලට ලී සපයන ජාවාරම්කරුවෝද සිටිති. විවිධ සහනාධාර අපේක්ෂාවෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත පැමිණෙන ප්‍රජාව ද පසුගිය දිනවල නිතර දක්නට විය.

එල්ලංගාව තුළ සැළකිය යුතු මුස්ලිම් ප්‍රජාවක් වාසය කරති. පාලු වැව, අලියා වැටුන වැව, තඹුත්ත වැනි ප්‍රදේශවල මෙම ප්‍රජාව ජීවත් වේ. මේ ප්‍රදේශවල ස්ථිර ගොඩනැගිලි තාප්ප වැට සමඟ ගම්මාන ක්‍රමයෙන් ව්‍යාප්ත වීමක් දක්නට ලැබේ. සත්ව පාලනය බහුලව දක්නට ලැබෙන්නේ ද මෙම ප්‍රජාව අතරතුරය. කෙසේ වෙතත් මෙම එල්ලංගාව තුළ ප්‍රජාව ඉතා දුෂ්කර ජීවිතයක් පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.

## 3.7. එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු

මෙම එල්ලංගාව තුළ මුල් යුගයේ ඉතා සීමිත ජනගහනයක් පදිංචිව ඇත. වාරවැට, ඉහළ ගිරිබාව, පහළ ගිරිබාව හා මයිලෑව යන පුරාණ ගම්වල මෙම ජනගහනය පදිංචි වී සිටිය ද පසුව ක්‍රමයෙන් ප්‍රදේශය පුරා ගම්මාන වශයෙන් ව්‍යාප්ත වෙමින් සිටී. මුල් යුගයේ සාර්ථකව කුඹුරු වගා කර ගත් බවත් ජලය ප්‍රමාණවත් වූ බවත් පැරණි ගාවීන් පවසයි. එහෙත් වර්තමානයේ මෙම තත්ත්වය සීඝ්‍රයෙන් වෙනස් වී ඇත. වැවෙහි ජලය රඳා පැවතීමක් නැත. පෝෂක ප්‍රදේශ වියලී ගොසින්ය. ජල මාර්ග හිදීගොස් ඇත. ඉදි, තල් වැනි ශුෂ්කකාමී ශාක හා පඳුරු වර්ධනය වෙමින් පවතී. රජයේ විවිධ ආධාර වැඩසටහන් ව්‍යාපෘති මගින් ප්‍රදේශයේ ජනතාවට සුළු වශයෙන් සහන ලබා සලසනු ලබයි. නියමිත කන්නයේ කුඹුරු 100% වගා කළ නොහැකිය. එල්ලංගාව හරහා වැටී ඇති මාර්ගය 2019 දක්වා පැවතියේ ඉතා අබලන් තත්ත්වයකය. එබැවින් ඉතා සීමිත ප්‍රවාහන පහසුකම් පැවති අතර වර්ථමානයේ එම තත්ත්වය තරමක් දුරට මග හැරී ඇත. අතීතයේ පැවති තාවකාලික නිවාස හා ජනාවාස ක්‍රමයෙන් වැඩිදියුණු වී ඇත. ස්ථිර නිවාස ඉදිවෙමින් පැවතිය ද වර්තමානයේ මෙම තත්ත්වය පසුබා ඇත. එල්ලංගාවේ සෑම ප්‍රදේශයකටම පාහේ විදුලිය ලැබී ඇතත් පානීය ජල ගැටලුව පවතී. ප්‍රදේශයේ නිදන් සොරුන් නිතර ගැවසෙන බවත් නිදන් ඇති බවත් ගොවියන් පවසති. දුර්වල වී වගා රටාවක් පවතින අතර ක්‍රමයෙන් ගොවීන් වෙනත් අතිරේක ආහාර භෝගවලට යොමුවෙමින් සිටී.

## 3.8. එල්ලංගාවේ පවතින ඉදිකිරීම්

එල්ලංගාව තුළ වැව් හා අමුණු 81 ක් පමණ ඇත. මේ අතුරෙන් වැව් 25 ක් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කරමින් පවතී. මින් එක් වැවක දැනට ඉදිකිරීම් කටයුතු අවසන් වී ඇත. සෙසු වැව්වල 30% ක් පමණ ඉදිකිරීම් සමස්ථයක් වශයෙන් අවසන් කර ඇත. එල්ලංගාව තුළ අලි මිනිස් ගැටුම ඉතා බරපතලය. මේ සඳහා විසඳුමක් වශයෙන් අලි වැට ඉදිකර ගැනීමට ප්‍රජාව උත්සාහ දරයි. සෑම වගා ඉඩමකම උඩ පැලක් හා අලි වැටක් ඉදිකර ඇත. තඹුත්ත, අලියා වැටුන වැව හා පාලුගම ප්‍රදේවල ස්ථිර ගොඩනැගිලි සත්ත්ව පාලන ඒකක ඉදිකරමින් පවතී. පාලු ගම විශාල කුකුලු ගොවිපලක් ඉදිකර ඇත. එහෙත් ගම්මුන්ගේ විරෝධතාවය මත  ගොවිපල ඇරබීමට නොහැකිවී ඇත. හෝටලයක් ඉදිකරමින් ඇති බවත් එහි අපවහන පද්ධතිය වැවට හරවා ඇතිබව ගොවි සංවිධානය පැවසීය. මහගල් කඩවල සිට ගිරිබාව දක්වා පාර කඩ, නිවාස හා වෙනත් ගොඩනැගිලි ඉදිකර ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල  වර්ල්ඩ් විශන් ආයතනය මගින් ඉදිකර ඇති  විශාල ගොඩනැගිල්ලේ පාවහන් කම්හලක් ඇත ඒ ප්‍රදේශයේ  කම්කරුවන් සේයව කරයි. මහල් 04 කින් යුත් ඉංග්‍රීසි පාසැලද එල්ලංගාවේ ඉදිකර ඇත.

## 3.9. එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව

පහළ ගිරිබාව එල්ලංගාවේ ගොවීන් 910 ක් පමණ බව වාර්තා පෙන්වයි. වැව් යටතේ වගා බිම් හෙක්ටයාර් 319 ක් ගෙවතු වගාව හෙක්ටයාර් 181 ක් බව සටහන් වේ. එහතේ වී වගාව හෙක්ටයාර් 483 ක් බව ද වගුව දක්වයි. කෙසේ වෙතත් හෙක්ටයාර් 6640 ක එල්ලංගා භූමියෙන් වගා ප්‍රදේශ වශයෙන් දැක්වෙන්නේ 15% පමණ වේ. ඉතිරිය වැව් කැලෑව, ලඳු කැලෑව හා මුඩුබිම් හා හඳුනා නොගත් බිම් පැවතිය හැකිය. මෙම ප්‍රදේශය රතු ලෝම හා වැලි මිශ්‍ර පසකින් යුක්තය. ඉතිරි භූමි ප්‍රදේශයෙන් වැව් හා කැලෑව හැරුණු විට කඳු හා සෙසු ප්‍රදේශ 85% ක් පමණ වේ. වෙනත් ස්ථිර බෝග 19% කි. ස්ථිර භෝග වශයෙන් පොල් හා අඹ වගාව ක්‍රමයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. මේ අතුරෙන් TOME JC අඹ වගාව පවතින දේශගුණික තත්ත්වයට හොඳින් ඔරොත්තු දෙන ශාකයක් බව පෙනේ. දේශගුණ සුහුරුවාරි තාක්ෂණ ව්‍යාපෘතිය යටතේ රටකජු වගාවට ගොවීන් නැඹුරු වී ඇත. මෙම යල කන්නයේ හෙක්ටයාර් 20 පමණ රටකජු වගා කර ඇත. ගොවින් රට කජු වගාවට විශේෂ නැඹුරුවක් දක්වයි. මීට අමතරව ගෙවතු වගාව වශයෙන් නයි මිරිස් හා එළවළු වගාව දක්නට ඇත. විශේෂයෙන් කාන්තාවන් මෙම ප්‍රදේශයේ වගාවට විශේෂ නැඹුරුවක් දක්වයි. මෙම පවතින දේශගුණ තත්ත්වය යටතේ හේන් වගාව අක්‍රිය වී ඇත. වර්ෂාව නොමැති වීමත්, අලින්ගෙන් සිදුවන හානියත් නිසා හේන් වගාවේ සීඝ්‍ර ව්‍යාප්තියක් නොපෙනේ. එතෙක් මෙම හේන්වල නිත්‍ය හිමිකරුවෝ සිටිති. අක්කර 01 - 04 දක්වා ප්‍රමාණයන්ට මොවුන් හිමිකම් කියති. මහ කන්නයේ බඩ ඉරිඟු, උඳු හා කව්පි බහුලව දැකගත හැකිය. ජල පහසුකම් අනුව පේර, ගස්ලබු, අඹ හා වෙනත් භෝග අක්කර 02 දක්වා වගා කිරීමට ගොවීන් නැඹුරු වී ඇත. එය ද ආයෝජන හැකියාව හා විශේෂයෙන් ම වගා ළිඳක් හෝ නළ ළිඳක් මගින් හෝ වෙනත් ජල මූලාශ්‍රයක් මගින් ජලය සපයාගත හැකි ස්ථානවල පමණක් මෙම වගාව සිදු වේ.

# 4. එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය

එල්ලංගාවේ වාරිමාර්ග කටයුතු ක්‍රිය වන්නේ මුළුමනින්ම ලැබෙන වර්ෂාපතනය අනුවයි. එතෙක් වැව්වල පවතින්නේ ඉතා සුළු ජල ප්‍රමාණයකි. භූ විෂමතාවය අනුව වැවෙන් ජලය ලබාගත හැකි වගා බිම්වල පමණක් දැඩි කළමනාකරණයක් යටතේ ජලය ලබාගෙන වගා කරයි. වැව් හා අමුණු වශයෙන් පවතින ජල මූලාශ්‍ර 81 ක් පමණ වර්ෂාව සමඟ සක්‍රීය වේ. ගොවි සංවිධානයේ මැදිහත්වීම මත ජලය බෙදාහැරීමක් සිදු වේ. කන්න රැස්වීම අනුව වගාව ආරම්භ කර ජල මුර ක්‍රමයට ජලය නිකුත් කෙරේ. වගා කන්නය සමඟ වාරිමාර්ග පද්ධතිය නඩත්තු වන අතර සෙසු කාලවල නඩත්තුවක් නොමැත. එල්ලංගාව තුළ ගොවි සංවිධාන 11 ක් පිහිටුවා ඇත. මෙම ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය වගා කන්නයට පමණක් සීමා වේ. මෙම සංවිධානවල එකම කණ්ඩායමක් දීර්ඝ කාලයක් නිලතල දරන බව පෙනේ. 50% වයස්ගත පුද්ගලයන් මේවායේ නිලතල හොබවති. මේ නිසාම නඩත්තුව හා මෙහෙයුම පිළිබඳව නව චින්තනයත්, ක්‍රියාකාරීත්වයත් සංවිධාන තුළ දක්නට නැත. මේ නිසාම වැව් හා වාර්මාර්ග පද්ධතියේ පුනරුත්ථාපනයෙන් පසුව පවත්වාගෙන යාමේ අවධානමක් පවතී. වර්තමාන ව්‍යාපෘතියේ

සැලකිය යුතු මුදලක් වැකන්ද හා වැව එළිපෙහෙළි කිරීමට වියදම් කිරීමට සිදු වී ඇත. විධිමත් නඩත්තුවක් නොමැතිවීම නිසා මෙම තත්ත්වය උදා වී ඇත. පද්ධතියේ වැව්වල පවතින ඉහත සීමිත ඉඩම් ප්‍රමාණයක් හා එම ප්‍රමාණය ද කුඩා කොටස්වලට බෙදීයාමෙන් හිමිකරුවන් ප්‍රදේශය හැර වෙනත් රැකියාවන් සඳහා එල්ලංගාවෙන් පිටතට යාමත් නිසා වාරිමාර්ග පද්ධතියේ නඩත්තුවට ඉඩම් හිමිකරුවන් සහභාගී කරවා ගැනීම දුෂ්කර වී ඇත.

## 4.1. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

පහළ ගිරිබාව එල්ලංගාව පහත සඳහන් අභියෝගයන්ට මුහුණ දෙමින් සිටී. පසුගිය වාර්ෂික චාරිකාවේ දී මෙන්ම, ගොවි සංවිධාන, එල්ලංගා කළමනාකරණ කමිටුව හා නිලධාරීන්, ක්ෂේත්‍ර චාරිකාවල දී හඳුනාගත් මෙම ගැටලු විශේෂ ස්ථානයක් ගනී. තවද එල්ලංගා පැතිකඩ වාර්ථාවට අනුව පහත අභියෝගයන් හඳුනාගෙන ඇත.

1. වැව් ඉස්මත්ත හා වැව් තාවුල්ල භූමිය අනවසරයෙන් අල්ලාගෙන වගා කිරීම.
2. අවිධිමත් සීමා මායිම් ලකුනු යොදාගෙන වැව ඉස්මත්ත හා එල්ලංගාවේ භූමිය, අනවසරෙයන් අල්ලා ගැනීම.
3. වැව ඉස්මත්තේ වන ආවරණයේ පෙරහණක් හෝ ගොඩවල නොමැති වීම නිසා වැව් වාර්ෂිකව දැඩිලෙස ගොඩබිමේ තර්ජනයට මුහුණ පෑම.
4. එල්ලංගාව තුල අනවසර වැලි ප්‍රවාහනය, වැලි කැපීම.
5. වැව්වල කට්ටකඩුව නොමැති වීමත්, කට්ටකඩුව අන්වාද්දම නිසා සහ කුණු ඇලවල් ගොඩ වීම නිසා ලවණතාවයකින් යුක්ත වීම, කුණු ඇලවල් ගොඩවීම හා කට්ටකඩුව, ගස්ගොම්මන විනාෂ වීම පාංශු ලවනතාවය ඉහළ යාමට හේතු වී ඇත.
6. පානීය ජලය නොමැති පාංශු ලවණතාවයකින් ජලය සිදීයාමත්, වැව්වල ජලය සීඝ්‍රයෙන් සිදීයාමත් නිසා පානීය ජලය සපයා ගැනීම ප්‍රබල ගැටලුවක් වී ඇත. වැව්වල ජලය රඳා නොපැවතීම, පොළොව අභ්‍යන්තරයට ජලය උරා නොගෙන මතුපිටින් වේගයෙන් කෙටි කාලයක් තුළ ජලය ගලා යාම වැනි කරුණු බලපා ඇත. මෙම තත්ත්වය නිසා ජලය වැවේ රඳා නොපැවතීමට බලපායි. රොන් මඩ හා වැලි වැව තුළට ගලා ඒමෙන් වැව් ගොඩවීම මෙයට විශේෂයෙන් ම බලපා ඇත.
7. එල්ලංගාවේ වැව්වල ජල කළමනාකරණ හා මෙහෙයුම් හා නඩත්තුව ඉතා දුර්වල මට්ටමක පැවතීම විශේෂ අවධානයට යොමු කලයුතු කරුණකි.
8. සමස්ථයක් වශයෙන් වැව් පද්ධතියේ ජලය හිඟ වීම, වර්ෂාව නියමිත වේලාවට නොමැතිවීම හෝ සම්පූර්ණයෙන් ම නොමැති විට (දේශගුණික විපර්යාසයට ගොදුරු වීම) නිසා වගා හානි හෝ වගාව ආරම්භ කිරීමට නොහැකි වීම බරපතල ගැටලුවකි. මෙම තත්ත්වය දීර්ඝ කාලයක් පැවතීමෙන් ගොවියන්ගේ ආර්ථික හා පෝෂණ මට්ටම පාලනයට ගැටලු ඇති විය හැකිය. මේ නිසා ප්‍රදේශයේ

ජීවත් වන ජනතාව උග්‍ර දරිද්‍රතාවයකට මුහුණ දෙනු ඇත. මෙම තත්ත්වයට ඔරොත්තු දෙන තාක්ෂණික සැලැස්මක් අවශ්‍ය වේ.

9. අලි මිනිස් ගැටුම එල්ලංගාව තුළ පවතින තවත් උග්‍ර ගැටලුවක් වී ඇත. අලි ගම් වැදීම වැලැක්විය නොහැකිය. ගොවීන්ගේ ගෙවතු නිවාස හා මිනිස් ජීවිත විනාශ කරමින් අලින් ගම්වල සැරිසරති. පොල්ගස් පෙරලීම, අඹ, කෙසෙල් වෙනත් එළවළු බඩ ඉරිඟු විනාශ කරයි. අලින් පමණක් නොව රිලවුන්, මොණරුන් හා වෙනත් සතුන් එල්ලංගාවේ ගොවි ජනතාවගේ ජීවන තත්ත්වයට උග්‍ර අභියෝගයක් එල්ල කරමින් සිටී.

## 4.2. හඳුනාගත් ගැටලු අතරින් සැලකිල්ලට භාජනය කළ උග්‍ර ගැටළු

වගුව 3

| අනු අංකය | උග්‍ර ගැටළුව | උග්‍ර ගැටළුවේ විෂය කේන්ද්‍රය |
|---|---|---|
| 1. | වැව්වල රක්ෂිත මායිම් නැත. මේ නිසාම ගොවීන් අනවසරයෙන් අල්ලා ගෙන ඇති ඉඩම් වගාවන් සඳහා යොදා ගනී. ඉඩමේ මායිම පැමිණ ඇත. වර්ෂා කාලයේ දී මෙම ඉඩම් යට වේ. මේ නිසා වැවේ නියමිත ජල ප්‍රමාණය පිරවීමට අනවසර ගොවීන් ඉඩ නොදීම නිසා වගාවට අවශ්‍ය ජල ප්‍රමාණය වැවේ රඳවා ගැනීමේ උග්‍ර ගැටලුවක් හටගෙන ඇත. | රක්ෂිත අල්ලා ගැනීම. |
| 2. | එල්ලංගාවේ පවතින හේන් වගාව හා එළිමහන් කැලය තුළ විවිධ වගාවන්ට සැකසීම නිසා පස සෝදා යාම. මේ නිසා වැව් ගොඩ වීම වැළැක්විය නොහැකි වීම. | පාංශු ඛාදනය ආරක්ෂිත වැටි නොමැතිකම. |
| 3. | වර්ෂාපතන විචලතාවය දේශගුණ විපර්යාසයන් නිසා පවතින උග්‍ර ජල හිඟයක් පැවතීම වැව්වලට ප්‍රමාණවත් ජලයක් නොලැබීම හා වැව්වල ජලය රඳා නොපැවතීම, මෙම හේතු මත වගා බිම් නිසි පරිදි වගා කිරීමට නොහැකි වීම, කුඹුරු හෙක්ටයාර් 378 ක ගොඩ ඉඩම් හෙක්ටයාර් 181 ක භූමි ප්‍රමාණයන් වගා කිරීමට නොහැකි වීම, උග්‍ර ජල හිඟය, පානීය ජලය පවා නොමැති වීම. | කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රමාණවත් ජලය හිඟකම. |
| 4. | අතීතයේ එල්ලංගා පද්ධතිය තුළ පැවති වැව්වල තිබූ ඉහත වටිනා අංගෝපාංග නැත (කට්ටකඩුව, පෙරණය, ගොඩවල, ගස්ගොම්මන, අපවහන ඇල පද්ධති ) අද වන විට හායනයට ලක් | දුර්වල මෙහෙයුම හා නඩත්තුව |

| | | |
|---|---|---|
| | වී ඇත. මෙම පද්ධතිවල අවශ්‍යතාවය නොදැනීම නිසා හෝ නොසලකා හැරීම නිසා (දිගු කලක්) මෙම පද්ධතිය හානියට පත් වී එහි ක්‍රියාකාරීත්වය දුර්වල වී ඇත. මේ නිසා පාංශු ලවණතාවය උග්‍ර වී ඇති අතර අස්වැන්න අඩුවීමටත් බලපායි. මෙම තත්ත්වය කළමනාකරණය කිරීම් ක්‍රම වේදයක් නොමැති වීම. | |
| 5. | ආයතනික ව්‍යුහයේ පවතින දුර්වල බව හා අසංවිධානාත්මක බව නිසා වාරිමාර්ග පද්ධතියේ පාලනයේ පවතින දුර්වලතාවය, අවධිමත් ආයතන ක්‍රියාකාරීත්වය, වගකීම් දැරීමේ දුබලතාවය. ඉහත කරුණු නිසා වාර්මාර්ග නඩත්තුව හා කළමනාකරණයේ දුර්වලතාවයන් පැවතීම. | දුර්වල මෙහෙයුම හා නඩත්තුව |
| 6. | ගොවි සංවිධාන කළමනාකාරීත්වය ඉතා දුර්වල මට්ටමේ පවතින අතර අයවැය මුදල් කළමනාකරණය ඉතා දුර්වලය. අරමුදල් නැත. මෙම හේතු නිසා ආයතනික සංවර්ධනය බිඳවැටී ඇත. නිලවරණ විධිමත්ව ව්‍යවස්ථානුකූලව පවත්වා නැත. මෙම ආයතන ගැටලුව බොහෝ අංග දුර්වල කරයි. මෙය උග්‍ර ගැටළුවක් සේ පවතී. | ආයතන සංවර්ධනයේ පවතින දුර්වලකම |
| 7. | එල්ලංගාවේ පහළ වැව් පද්ධතියේ මිරිදිය මත්ස්‍ය වගාව ඉතා දුර්වල බව ගොවීන් කියති. මෙය බරපතල ප්‍රශ්නයක් බවත් බෑම් සිදීයාම මෙයට ප්‍රධාන ගැටළුවකි. | මිරිදිය මත්ස්‍ය වගාව දුර්වලයි. |
| 8. | එල්ලංගාවේ නිෂ්පාදන මිලට ගැනීම හා අලෙවිය සඳහා මාර්ග පද්ධතිය ඉතා වැදගත් වේ. සංවර්ධනයේ දී ප්‍රතිපත්ති සම්පාදකයන් සැලසුම්කරුවන් මේ සඳහා විශේෂ අවධානයක් යොමු කරයි. පාලු වැව හා මැදවච්චිය වරා වැව දක්වා 8 km ක් පමණ වන මාර්ගවල දුර්වලතා පැවතීම. | දුර්වල යටිතල පහසුකම් |
| 9. | නිදැල්ලේ යන ගවයන් හා එළුවන් එල්ලංගාව තුළ ප්‍රබල ගැටළුවක් ඇති කරයි. මෙම සතුන් ගාල් වශයෙන් දිනපතා ගමන් කිරීම ඇලවේලි, වෑ කන්ද හා වගාවන් හානි කරයි. තවද නිදැල්ලේ ගවයන් හැසිරීම නිසා වගාහානී වැඩිවීමත් වගාවන් පවත්වාගෙන යාමේ දුෂ්කරතාවයන් ඇත. | පාංශු ඛාදනය හා වගා හානි |
| 10. | එල්ලංගාව හා එම තදාසන්න ප්‍රදේශයේ නිරන්තරයෙන් අලි මිනිස් ගැටුම් උග්‍ර වී ඇත. අලි ගහනය වැඩිවීම, මිනිසුන් කැලෑව ආක්‍රමණය කිරීම, වගා හානි, නිවාස කඩා බිඳ දැමීම හා ජීවිත හානි මෙම ගැටලුවේ උග්‍ර බව පිළිඹිබු කරයි. | අලි මිනිස් ගැටලුව |

## 4.3. පහළ ගිරිබාව හරස්කඩ චාරිකාවෙන් හදුනාගත් ප්‍රමුඛතාගත කල ගැටලු හා යෝජිත උපාය මාර්ග හා සැලැස්ම

එල්ලංගා කළමණාකරන කමිටුව විසින් උග්‍ර ගැටළු විසඳා ගැනීම හෝ අවම කිරීම සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්

වගු අංක 4

| අනු අංක | උග්‍ර ගැටළු | යෝජිත උපාය මාර්ග හා සැලැස්ම |
|---|---|---|
| 1 | වැවේ ඉඩම් අනවසරයෙන් අල්ලාගෙන ඇත.<br>වැව් වල රක්ෂිත, මායිම් කර නොමැති වීම. | i. අනවසරයෙන් අල්ලාගත් භූමි සහිත වැව් නිශ්චය කිරීම<br>ii. අනවසරකරුවන් හදුනා ගැනීම<br>iii. ගොවි සංවිධානය දැනුවත් කිරීම<br>iv. ඒකාබද්ධ රැස්වීමක් පැවැත්වීම<br>v. වැව් මැනීම හා මායිම් සළකුණු කිරීම<br>vi. ගල් දැමීම |
| 2 | එල්ලංගාව තුල කැලෑව හෙලිකිරීම.<br>හේන් වගාව.<br>හේන් වගාව නිසා පස සේදීයාම.<br>වැව් ගොඩවීම. | i. අදාල ගොවීන් හදුනා ගැනීම<br>ii. ගොවි සංවිධාන දැනුවත් කිරීම<br>iii. එල්ලංගාව තුල කැලෑව හෙලිකිරීම හා හේන් වගාවෙන් එල්ලංගාවට සිදුවන හානිය පිලිබඳව වීදි නාට්‍ය 5ක් මගින් ගොවීන් දැනුවත් කිරීම<br>iv. සෘජුව පාංශු ඛාදනයට මුහුණ දෙන ස්ථාන හා ඉඩම් හදුනා ගැනීම<br>v. පාංශු සංරක්ෂණ වැටි දැමීම හා වැටි මත වගා කිරීම පිලිබඳව ගොවීන්, අනවසර කරුවන් දැනුවත් කිරීම. ඉලක්ක ගත වැඩ සටහනක් අනුව වැටි දැමීම<br>vi. පාංශු ඛාදනය හා වැව් ගොඩ වීමට බලපාන ස්ථාන හදුනා ගැනීම හා සලකුණු කිරීම<br>vii. ගොඩ වල හා පෙරහන නිර්මාණය කිරීම හා සුදුසු වන වගාවක් ඇති කිරීම<br>viii. දැනට පවතින හේන් වගා භූමි ප්‍රදේශය වාර්ෂිකව නිවැරදි සංගණනයක් මගින් කළමනාකරණය කිරීම<br>ix. කැලෑව අලුතින් කපා හේන් වගා කිරීමට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියාමාර්ග ගැනීම<br>x. දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රම හා අළවිය පිලිබඳව හේන් වගාකරුවන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් වසරක් පාසා පැවැත්වීම |
| 3 | වර්ෂාපතන විචල්‍යතාවය<br>යල හා මහ කන්න වල විශාල ඉඩම් ප්‍රමානයක් (කුඹුරු) කිසිම වගාවක් නොමැතිව පැවතීම. | i. අදාල ගොවීන් හදුනා ගැනීම<br>ii. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම<br>iii. අවම තෙතමනය යටතේ කල හැකි වගාවන් පිළිබඳව හදුන්වා දීම |

| | | |
|---|---|---|
| | | iv. කුඹුරු වල ඒ ඒ වගාවන්ට සුදුසු බිම් සැකසීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම හා වගා කුඹුරු වෙන් කොට හඳුනා ගැනීම<br>v. පවතින නීතිමය බාධාවන් ඉවත් කිරීම<br>vi. එල්ලංගාව තුල කුඹුරු වල වගා ළිං කැපීමට උනන්දු කිරීම (උදා:- පදවිය ව්‍යාපාරය )<br>vii. වාර්ෂිකව වගා සැලැස්මක් සකස් කිරීම හා ප්‍රගතිය සමාලෝචනය<br>viii. ඒකාබද්ධ අළවි වැඩ සටහනක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම<br>ix. කැකුළන් වගාවට ගොවීන් නැඹුරු කිරීම |
| 4 | පාංශු ලවනතාවය උග්‍රයි.<br>කට්ට කඩුය නැත. | i. අදාල ගොවීන් හඳුනා ගැනීම<br>ii. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම<br>iii. කට්ට කඩුව නිරීක්ෂණය කර එකාබද්ධ ක්‍රියාන්විතයකින් කට්ට කඩුව වෙන් කිරීම<br>iv. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම සඳහා පැල සිටුවීම<br>v. කුණු ඇල හා රක්ෂිත වෙන් කිරීම හා ගොඩ දැමීම<br>vi. කුණු ඇල රක්ෂිත දෙපස සුදුසු ශාඛ සිටුවීම<br>vii. කිවුලට ඔරොත්තු දෙන බීජ වර්ග හා බෝග හඳුන්වා දීම |
| 5 | වැව් හා පද්ධතියේ දුර්වල මෙහෙයුම හා නඩත්තුව | i. ගොවීන්ට සහ ගොවි සංවිධාන නායකයින්ට ඒමගින් මෙහෙයුම හා නඩත්තුව පිළිබඳව පුහුණු වැඩ මුලු 3 ක් පැවැත්වීම<br>ii. වැව සහ ඇළ වල් ක්‍රමානුකූලව නඩත්තු කිරීම සඳහා නඩත්තු සැලැස්මක් හා අවම ඇස්තමේන්තුවක් සැකසීම සඳහා ගොවි සංවිධානයට සහාය ලබා දීම<br>iii. අඛණ්ඩව ඇලවල් නඩත්තු කිරීම සඳහා සෑම ගොවි සංවිධානයකටම තණකොල කපන යන්ත්‍රයක් ලබා දීම<br>iv. නඩත්තු අරමුදලක් ගොඩ නැගීමට ගොවි සංවිධානය යොමු කිරීම<br>v. නඩත්තු කමිටුවක් පිහිටුවීම |
| 6 | ගොවි සංවිධාන ක්‍රියාකාරීත්වයේ පවතින දුර්වලකම | i. ගොවි සංවිධාන නිලධාරීන් සඳහා දින 03 ක විදිමත් පුහුණුවක් ලබා දීම<br>ii. ගොවි සංවිධානය සඳහා ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර පසු විපරම් කිරීම හා අධීක්ෂණය<br>iii. කෘෂි සහකාරවරුන් සඳහා පුහුණුවක් ලබාදී ම<br>iv. ගොවීන් සහ ගොවි සංවිධාන වල සාමාජිකයින් දැනුවත් කිරීම |

| | | |
|---|---|---|
| 7 | මිරිදිය මත්ස්‍ය වගාව ඉතා දුර්වලයි | i. වැව් වල තත්වය හා ජලය රඳා පැවැත්ම අනුව මත්ස්‍ය පැටවු න් දැමීම (මිරිදිය මත්ස්‍ය වගාව ) |
| 8 | එල්ලංගාව තුල ඇති අභ්‍යන්තර මාර්ග 02 ක් ඉතා අබලන් තත්වයේ පැවතීම | i. ඒකාබද්ධ නිරක්ෂණයකට භාජනය කිරීම<br>ii. සුදුසු අලුත්වැඩියාවකට යොමු කිරීම |
| 9 | නිදැල්ලේ යන ගවයන් හා අවිධිමත් ගව පාලනය නිසා සිදුවන හානි<br>o ඇලවේලි හා වැව් බන්ට් හානියට පත්වීම<br>o වගා හානිය<br>o යල කන්නය සැලසුම් කිරීමේදී සිදුවන බාධාවන් | i. ගව හිමියන් හදුනාගැනීම හා දැනුවත් කිරීම<br>ii. ගව පාලනයට හා මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා සුදුසු කලාපයක් වෙන් කිරීම<br>iii. තණ වගාව වැඩිදියුනු කිරීම<br>iv. උසස් ආරයේ සතුන් බෝ කිරීමේ ක්‍රම ව්‍යාප්තිය හා දැනුවත් කිරීම |
| 10 | නිරන්තරයෙන් සිදුවන අලි මිනිස් ගැටුම | i. පවතින අලිවැට අලුත්වැඩියාව සහ ඊට සමානුපාතිකව අහලක් කැපීම<br>ii. වනජීවී කලාපය තුල පිහිටි පනාගම්මන සහ දෙයියන්ගේ වැව වනසතුන්ට ජලය අලුත්වැඩියාව<br>iii. අලීන්ගේ ආහාර ලෙස කැලෑව තුල කැලෑවට ආවේණික බෝග වර්ග වැවීම |

## 5 එල්ලංගා කළමනාකරණයේ මූලික සැලැස්ම

එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුවට එල්ලංගාව සහ ජල පෝෂක ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට මගපෙන්වයි. සහභාගීත්ව ක්‍රමවේද යටතේ සියලු හවුල්කාර ආයතනවල මැදිහත් වීමෙන් එල්ලංගා පැතිකඩෙන් හඳුනාගත් උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සංවර්ධනය කර ඇත. හඳුනාගත් මැදිහත් වීම්, කාලවකවානු, යෝජිත මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන ඇතුලත් (Gannt) සටහනින් ඉහත කාර්යය පහසු වී ඇත. වගු අංක ....... හි මෙම සටහනට අනුපූර්වකයක් ලෙස එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මේ ඇතුලත් සෑම මැදිහත්වීමක් සඳහාම වැය වන දල වියදම සහ හවුල්කාර ආයතන, පෞද්ගලික අංශය සහ ප්‍රජා මූල සංවිධාන වලින් අපේක්ෂිත දායකත්වය හා ආධාර ලබාදෙන ආයතන වලින් අපේක්ෂිත මූල්‍ය දායකත්වය දක්වා ඇත. එසේම වගු අංක ........හි දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතියෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මැදිහත් වීම් වල දල වියදම හා ක්‍රියාත්මක කිරීමේ කාලවකවානු දක්වා ඇත.

### 5.1 පහළ ගිරිබාව එල්ලංගා පැතිකඩ හා මූලික සංවර්ධන සැලැස්ම

වගු අංක - 5

| 5 | උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම | දළ පිරිවැය (රු.මි) | කාලරාමුව | | | | | | | | | | | | | | ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ආයතනය මැදිහත්වීම් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | කෙටිකාලීන ජූලි - දෙසැම්බර් 2023 | | | | | | මධ්‍යකාලීන ජන - දෙසැ 2024 | | | | දිගුකාලීන ජන - දෙසැ 2025 | | | | | |
| | | | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ | කා 1 | කා 2 | කා 3 | කා 4 | කා1 | කා 2 | කා 3 | කා 4 | ප්‍රධාන | අනෙකුත් |
| 1 | i. අනවසරයෙන් අල්ලාගත් භූමි සහිත වැව් නිශ්චය කිරීම | 4 | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉ. කො .දෙපාර්ථමේන්තුව, මිනින්දෝරු දෙපාර්ථමේන්තුව | ගොවි සංවිධාන, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, දේ. සු. වාරි කෘෂි ව්‍යාපෘතිය |
| | ii. අනවසරකරුවන් හඳුනා ගැනීම | | | | | | | | | | | | | | | | | |
| | iii. ගොවි සංවිධානය දැනුවත්කිරීම ඒකාබද්ධ රැස්වීමක් පැවැත්වීම | | | | | | | | | | | | | | | | | |
| | iv. වැව් මැනීම හා මායිම් සළකුණු කිරීම | 2 | | | | | | | | | | | | | | | | |
| | v. ගල් දැමීම | | | | | | | | | | | | | | | | | |
| 2 | i. එල්ලංගාව තුල කැලැව හෙලිකිරීමට අදාල ගොවීන් හඳුනා ගැනීම | 1 | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ගොවි සංවිධානය, ප්‍රා. ලේ. කාර්යාලය | ගොවි සංවිධානය, දේ. සු. වාරි කෘෂි ව්‍යාපෘතිය |
| | ii. ගොවි සංවිධාන දැනුවත් කිරීම | 0.2 | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දේ. සු. වා. කෘ. ව්‍යාපෘතිය, කෘෂි. දෙපා. | ගොවි සංවිධාන |
| | iii. එල්ලංගාව තුල කැලැව හෙලිකිරීම හා හේන් වගාවෙන් එල්ලංගාවට සිදුවන හානිය පිලිබඳව වීදි නාට්‍ය 3 ක් මගින් ගොවීන් දැනුවත් ටකිරීම. | 1 | | | | | | | | | | | | | | | දේ. සු. වාරි කෘෂි. ව්‍යාපෘතිය<br>ගොවි සංවිධාන | ගොවි සංවිධාන, ප්‍රජා මුල සං. |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | iv. සෘජුව පාංශු ඛාදනයට මුහුණ දෙන ස්ථාන හා ඉඩම් හඳුනා ගැනීම. | 0.05 | | | | | | | | | | | | | | | කෘෂි දෙපා. ,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>පළාත් වා. දෙ . | ගොවි සංවිධාන<br><br>දේ. සු. වාරි කෘෂි ව්‍යාපෘතිය |
| | v. පාංශු සංරක්ෂණ වැටි දැමීම හා වැටි මත වගා කිරීම පිලිබඳව ගොවීන් / අනවසර කරුවන් දැනුවත් කිරීම. ඉලක්ක ගත වැඩ සටහනක් අනුව වැටි දැමීම. | 6 | | | | | | | | | | | | | | | කෘෂි දෙපා. ,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>අදාල ගොවි මහතුවරුන්,<br>පළාත් වා. දෙ. ,<br>පොලිසිය | දේ. සු. වාරි කෘෂි ව්‍යාපෘතිය,<br>ගොවි සංවිධාන |
| | vi. පාංශු ඛාදනය හා වැව් ගොඩවීමට බලපාන ප්‍රෙද්ශ හඳුනා ගැනීම හා සලකුණු කිරීම. | | | | | | | | | | | | | | | | පළාත් වාරිමාර්ග දෙ. ,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>ප්‍රා. ලේ. කාර්යාලය | දේ. සු. වාරි කෘෂි ව්‍යාපෘතිය,<br>ගොවි සංවිධාන |
| | vii. ගොඩ වල හා පෙරහන නිර්මාණය කිරීම හා සුදුසු වන වගාවක් ඇති කිරීම. | 3 | | | | | | | | | | | | | | | දේ. සු. වාරි කෘෂි ව්‍යාපෘතිය,<br>වන. සං. දෙ. ,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>ප්‍රා. ලේ. කා. | ගොවි සංවිධාන,<br>වෙනත් ස්වේච්ඡා සංවිධාන,<br>ගොවි සං. |
| | viii. දැනට පවතින හේන් වගා භූමි ප්‍රදේශය වාර්ෂිකව නිවැරදි සංගණනයක් මගින් කළමනාකරණය / නියාමනය කිරීම. | | | | | | | | | | | | | | | | වන සං. දෙ. ,<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>ප්‍රා. ලේ. කා. ,<br>පොලිසිය | ගොවි සංවිධාන,<br>දේ. සු. වාරි කෘෂි ව්‍යාපෘතිය |
| | ix. කැලෑව අලුතින් කපා හේන් වගා කිරීමට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියාමාර්ග ගැනීම. | 0.02 | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>ප්‍රා. ලේ. කා. ,<br>පොලිසිය | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | x. දේශගුණ සුහුරු කෘෂිකාර්මික ක්‍රම හා අළවිය පිලිබඳව හේන් වගාකරුවන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් වසරක් පාසා පැවැත්වීම. | | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව, ප්‍රා. ලේ. කා. , පොලිසිය | ගොවි සංවිධාන, දේ. සු. වාරි කෘෂි ව්‍යාපෘතිය |
| 3 | **i.** අදාල ගොවීන් හඳුනා ගැනීම. | 0.05 | | | | | | | | | | | | | | | කෘෂි දෙපා. , ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව, පළාත් වා. දෙ. | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| | **ii.** ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම. | 0.05 | | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, කෘෂි දෙපා. , ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව | ගොවි සංවිධාන |
| | **iii.** අවම තෙතමනය යටතේ කල හැකි වගාවන් පිළිබඳව හඳුන්වා දීම. | 0.05 | | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, කෘෂි දෙපා. , ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව, ප්‍රා. ලේ. කා. | ගොවි සංවිධාන |
| | **iv.** කුඹුරු වල ඒ ඒ වගාවන්ට සුදුසු බිම් සැකසීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම හා වගල් කුඹුරු වෙන් කොට හඳුනා ගැනීම. | 0.2 | | | | | | | | | | | | | | | කෘෂි දෙපා. , ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව, ප්‍රා. ලේ. කා. | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **v.** පවතින නීතිමය බාධාවන් ඉවත් කිරීම. | | | | | | | | | | | | | | | | ප්‍රා. ලේ. කා. , දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, කෘෂි දෙපා. , ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව | ගොවි සංවිධාන |
| | **vi.** එල්ලංගාව තුල කුඹුරු වල වගා ළිං කැපීමට උනන්දු කිරීම. (උදා: - පදවිය ව්‍යාපාරය) | 8 | | | | | | | | | | | | | | | ප්‍රා. ලේ. කා. , දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, කෘෂි දෙපා. , ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව | ගොවි සංවිධාන |
| | **vii.** වාර්ෂිකව වගා සැලැස්මක් සකස් කිරීම ක්‍රියාත්මක කිරීම හා ප්‍රගතිය සමාලෝචනය. | 0.02 | | | | | | | | | | | | | | | ප්‍රා. ලේ. කා. , දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, කෘෂි දෙපා. , ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව | ගොවි සංවිධාන |
| | **viii.** ඒකාබද්ධ අළවි වැඩ සටහනක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම. | | | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, කෘෂි දෙපා. , ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව | ගොවි සංවිධාන, නිශ්පාදන සංගමය |
| 4 | i. අදාල ගොවීන් හා ප්‍රදේශ හදුනා ගැනීම. | 0.02 | | | | | | | | | | | | | | | ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තව, ප්‍රා. ලේ. කා. , | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | |
| | ii. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම. | | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තව, ප්‍රා. ලේ. කා. , පළාත් වා. දෙ. , පොලිසිය | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| | iii. කට්ටකඩුව නිරීක්ෂණය කර එකාබද්ධ ක්‍රියාන්විතයකින් කට්ටකඩුව වෙන් කිරීම. | 0.02 | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපා. , ප්‍රා. ලේ. කා. , පළාත් වා. දෙ. , පොලිසිය | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| | iv. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම සඳහා පැල සිටුවීම. | 0.05 | | | | | | | | | | | | | | | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවි සංවිධාන, වන සං. දෙ. | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| | v. කුණු ඇල හා රක්ෂිත වෙන් කිරීම හා ගොඩ දැමීම. | 3 | | | | | | | | | | | | | | | | |
| | vi. කුණු ඇල රක්ෂිත දෙපස සුදුසු ශාක සිටුවීම. | 2 | | | | | | | | | | | | | | | ගොවි සංවිධාන, වන සං. දෙ. | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| | vii. කිවුලට ඔරොත්තු දෙන බීජ වර්ග හා බෝග හඳුන්වා දීම. | 2 | | | | | | | | | | | | | | | කෘ. දෙ. , ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5 | i. | ගොවීන්ට සහ ගොවි සංවිධාන නායකයින් සඳහා Tank නඩත්තුව පිළිබඳව පුහුණු වැඩ මුලු 3 ක් පැවැත්වීම | | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පලාත් වාරි. දෙ. | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| | ii. | වැව සහ ඇළ වල් ක්‍රමානුකූලව නඩත්තු කිරීම සඳහා නඩත්තු සැලැස්මක් හා අවම ඇස්තමේන්තුවක් සැකසීම සඳහා ගොවි සංවිධානයට සහාය ලබා දීම | 0.02 | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පලාත් වාරි. දෙ. | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| | iii. | නිරන්තරව හා අඛණ්ඩව ඇල වල් නඩත්තු කිරීම සඳහා සෑම ගොවි සංවිධානයකටම තණකොල කපන යන්ත්‍රයක් ලබා දීම | 0.16 | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පලාත් වාරි. දෙ. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| | iv. | නඩත්තු අරමුදලක් ගොඩ නැගීමට ගොවි සංවිධානය යොමු කිරීම | | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| | v. | නඩත්තු කමිටුවක් පිහිටුවීම | | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පලාත් වාරි. දෙ. | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| 6 | **i.** | ගොවි සංවිධාන නිලධාරීන් සඳහා දින 03 ක විධිමත් පුහුණුවක් ලබා දීම | 0.5 | | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **ii.** ගොවි සංවිධානය සඳහා ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර පසු විපරම් කිරීම හා අධීක්ෂණය | | | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | **iii.** කෘ කිශ් සහකාර වරුන් සඳහා පුහුණුවක් ලබාදී ම | 0.5 | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | ගොවි සංවිධාන |
| | **iv.** ගොවීන් සහ ගොවි සංවිධාන වල සාමාජිකයින් දැනුවත් කිරීම | 0.1 | | | | | | | | | | | | | | | ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | ගොවි සංවිධාන |
| 7 | 1 වැව් වල තත්වය හා ජලය රඳා පැවැත්ම අනුව මත්ස්‍ය පැටවුන් දැමීම (මිරිදිය මත්ස්‍ය වගාව ) | 2 | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, මිරිදිය ධීවර සං. දෙ. , පළාත් මිරිදිය ධීවර සං. දෙ. | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| 8 | i. ඒකාබද්ධ නිරීක්ෂණයකට භාජනය කිරීම. (අභ්‍යන්තර මාර්ග අලුත්වැඩියාව) | 0.02 | | | | | | | | | | | | | | | ගිරිබාව ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන, ගොවිජන සංවර්ධනදෙපා ර්තමේන්තුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| | ii. සුදුසු අලුත්වැඩියාවකට යොමු කිරීම | 3 | | | | | | | | | | | | | | | ගිරිබාව ප්‍රාදේශීය සභාව, | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 9 | i. ගව හිමියන් හඳුනාගැනීම හා දැනුවත් කිරීම. | 0.05 | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ගොවි සංවිධාන |
| | ii. ගව පාලනයට හා මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා සුදුසු කලාපයක් වෙන් කිරීම. | | | | | | | | | | | | | | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්ථමේන්තුව, පළාත් සත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපා. | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු ව |
| | iii. තෘණ වගාව වැඩිදියුනු කිරීම. | 1 | | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, පළාත් සත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපා. , කිරි නිශ්පාදන සංවිධාන | ගොවි සංවිධාන, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ව |
| | iv. උසස් ආරයේ සතුන් බෝ කිරීමේ ක්‍රම ව්‍යාප්තිය.<br>v. දැනුවත් කිරීම.<br>vi. කිරි නිශ්පාදන කමිටුවක් එල්ලංගාව මට්ටමින් පිහිටුවීම. | 0.1 | | | | | | | | | | | | | | | පළාත් සත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපා. , ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | ගොවි සංවිධාන, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ව |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | I. පවතින අලි වැට අලුත්වැඩියාව හා අවශ්‍ය ප්‍රදේශ සඳහා නව අලිවැටක් ඉදිකිරීම. | 0.5 | | | | | | | | | | | | | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවි සංවිධාන |
| | II. වනජීවී කලාපය තුල පිහිටි වගා බිම් සඳහා කාලීන අලිවැට හඳුන්වා දීම. | | | | | | | | | | | | | | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| | III. හේන් වගාව කර අස්වනු නෙලාගත්පසු අලින්ට ආහාර සඳහා අතහැර දැමීම හා ඒම වගා සැලැස්ම පිළිබඳව දැනුවත් කිරීම. | 0.05 | | | | | | | | | | | | | | | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ගොවි සංවිධාන, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |

4.2.8 සැලැස්මට අනුව අපේක්ෂිත මැදිහත්වීම් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රධාන කටයුතු සඳහා වැයකිරීමට සිදුවිය හැකි වියදම දළ වශයෙන් පහත වගුවේ දැක්වේ. (මෙය දළ සටහනක් බවත් සත්‍ය වශයෙන් වන වියදම මෙයට වඩා වැඩි හෝ අඩුවිය හැකි බවත් සටහන් තබමි.)

5.2. යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්, වැය වන මුදල සහ පාර්ශවකරුවන්ගෙන් අපේක්ෂිත දල මූල්‍ය දායකත්වය, ඇස්තමේන්තුගත වියදම

වගු අංක 6- ඇස්තමේන්තුගත වියදම

| අංක | යෝජිත ප්‍රධාන කටයුතු | ආසන්න වියදම (රු. වලින් ) | | | | |
|---|---|---|---|---|---|---|
| | | මුලු වියදම (රු.මි) | පෞද්ගලික අංශයේ දායකත්වය | පාර්ශවකාර ආයතන වල දායකත්වය | ප්‍රජා දායකත්වය | ආධාර සපයන ආයතන වලින් අපේක්ෂිත මුදල |
| 1 | වැවේ ඉඩම් අනවසරයෙන් අල්ලාගෙන ඇත.<br>වැව් වල රක්ෂිතය මැණුම් කර මායිම් කණු දැමීම. | 6 | | | 0.6 | |
| 2 | එල්ලංගාව තුල හේන් වගාව නිසා පස සේදීයාම වැව් ගොඩවීම. | 11 | | | 1.12 | |
| 3 | වර්ෂාපතන විචල්‍යතාවය නිසා යල හා මහ කන්න වල විශාල ඉඩම් ප්‍රමානයක් (කුඹුරු) කිසිම වගාවක් නොමැතිව පැවතීම. | 8 | | | 0.83 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | පාංශු ලවනතාවය උග්‍රයි කට්ටකඩුය නැත. | 7 | | | 0.709 | |
| 5 | වැව් හා පද්ධතියේ දුර්වල මෙහෙයුම හා නඩත්තුව. | 0.5 | | | 0.018 | |
| 6 | දුර්වල ගොවි සංවිධාන ශක්තිමත් කිරීම. | 1.1 | | | 0.11 | |
| 7 | මිරිදිය මත්ස්‍ය වගාව වැඩිදියුණු කිරීම. | 2 | | | 0.02 | |
| 8 | එල්ලංගාව තුල ඇති අභ්‍යන්තර මාර් 02 ක් ඉතා අබලන් තත්වයේ පැවතීම. | 3.02 | | | 5.02 | |
| 9 | නිදැල්ලේ යන ගවයන් අවිධිමත් ගව පාලනය නිසා වන හානි වැලැක්වීම.<br>• ඇලවේලි, වැව් බන්ට් හානියට පත්වීම<br>• වගා හානිය<br>• යල කන්නය සැලසුම් කිරීමේදී සිදුවන බාධාවන් | 1.05 | | | 0.105 | |
| 10 | නිරන්තරයෙන් සිදුවන අලි මිනිස් ගැටුමට විසඳුමක් ලබාදීම | 0.55 | | | 0.055 | |
| | එකතුව | 40.22 | | | | |

## 5.3. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය තුල එමගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන ක්‍රියාකාරකම්

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය එහි ව්‍යාපෘති කාලය තුල පහළ ගිරිබාව එල්ලංගා කළමණාකරන සැලැස්මේ ඇතුලත් උපාය මාර්ගික මැදිහත්වීම් වලට මූල්‍ය සහාය ලබාදීමට අදහස් කර ඇත. තවද දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ කාර්යය මණ්ඩලය හරහා හඳුනාගත් මැදිහත්වීම් සඳහා උප ව්‍යාපෘති වාර්ථා සකස් කිරීමටද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහාය ලබාදෙනු ඇත. එසේම යෝජිත මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින පාර්ශවකාර ආයතන එල්ලංගා කළමණාකරන කමිටුව සමඟ සබඳතාවයකින් යුක්තව කටයුතු කල යුතුය. දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් තෝරාගත් මැදිහත්වීම් වල ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ දල වියදම් ඇස්තමේන්තු සහ කාලරාමුව පහත වගුවෙහි දැක්වේ.

වගු අංක 7 - උපායමාර්ගික මැදිහත්වීම් වල ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවා ක්‍රියාත්මක කාල රාමුව

| අනු අංක | යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් | ආසන්න වියදම් (රු.) | 2023 | | | | | 2024 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. |
| 1 | වැවේ ඉඩම් අනවසරයෙන් අල්ලාගෙන ඇත.<br>ඒම වැව් වල රක්ෂිත, මායිම් ලකුණු කර ගල් දැමීම. | 6 | | | | | | | | | |
| 2 | එල්ලංගාව තුල හේන් වගාව නිසා පස සේදීයාම වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම. | 11 | | | | | | | | | |
| 3 | යල හා මහ කන්න වල සුදුසු ඉඩම් තෝරා අතිරේක ආහාර බෝග වගාව ප්‍රචලිත කිරීම ගොවීන් පුහුණු කිරීම.<br>කැකුලන් ක්‍රමයට වී වගාව සඳහා ගොවීන් යොමු කිරීම. | 8 | | | | | | | | | |
| 4 | පාංශු ලවනතාවය උග්‍ර වීම - කට්ට කඩුව නැත.<br>කට්ට කඩුව, ගස්ගොම්මන, ඉස්වැටිය යනාදී වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය නැවත ස්ථාපනය කිරීම. | 7 | | | | | | | | | |
| 5 | ගොවි සංවිධාන කළමනාකරණය හා මෙහෙයුම් නඩත්තු කටයුතු පිළිබඳව පුහුණු කිරීම. | 0.18 | | | | | | | | | |
| | ගොවි සංවිධාන වලට තණකොල කපන යන්ත්‍ර කට්ටලයක් ලබාදීම. | 0.32 | | | | | | | | | |
| 6 | දුර්වල ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා පුහුණුවක් ලබා දීම. | 1.1 | | | | | | | | | |
| 7 | මිරිදිය මත්ස්‍ය වගාව වැඩිදියුණු කිරීම. | 2 | | | | | | | | | |
| 8 | එල්ලංගාව තුල ඇති අභ්‍යන්තර මාර් 06 ක් අලුත්වැඩියා කිරීම. | 3.02 | | | | | | | | | |
| 9 | අවිධිමත් ගව පාලනය නිසා සිදුවන හානි වැලැක්වීම. | 1.05 | | | | | | | | | |
| 10 | නිරන්තරයෙන් සිදුවන අලි මිනිස් ගැටුමට විසඳුමක් ලබාදීම. | 0.55 | | | | | | | | | |
| | | 40.22 | | | | | | | | | |

## 5.4 එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය

එල්ලංගා කළමණාකරන කමිටුව විසින් එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවට අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වන අතර එය දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට දැන ගැනීම සඳහා ඉදිරිපත් කල යුතුය. අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එල්ලංගා කළමණාකරන කමිටුව අදාල හවුල්කාර ආයතන වලද සහාය ඇතිව සංකල්ප පත්‍රිකා හෝ උප ව්‍යාපෘති යෝජනා (ඇමුණුම් අංක 04) සකස් කර ඒවා මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා අරමුදල් ලබා දෙන ආයතන වෙත ඉදිරිපත් කල යුතුය. ප්‍රධාන හවුල්කාර ආයතන එනම් හදුනාගත් මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින ආයතන තාක්ෂණික සැලසුම්, අයවැය වාර්ථා සහ ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කර ආධාර ලබාදෙන ආයතන වෙත යෝජනා ඉදිරිපත් කිරීම සඳහා එල්ලංගා කළමණාකරන කමිටුවට සහාය ලබාදිය යුතුවේ. උප ව්‍යාපෘති වාර්තා ක්‍රියාත්මක කිරීමේ තත්වය පිලිබඳ සමාජ විගණනය (Social Auditing) සඳහා ගොවි සංවිධාන වල සහාය ඇතිව ප්‍රතිලාභීන් අතුරින් සමාජ විගණන කමිටු (Social Audit Committees) පත් කර ප්‍රතිලාභීන්ගේද ක්‍රියාකාරී දායකත්වය ලබාගෙන එල්ලංගා කළමණාකරන කමිටුව විසින් ඉටුකරනු ලබන වැඩ වල ගුණාත්මකභාවය ඉහල නංවා ගැනීම සඳහා කටයුතු කල යුතුවේ.